ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 දෙසැම්බර් මස 13 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 ඔක්තෝබර්

### සමස්ත නිරීක්ෂණ

ආනයන වියදම අඩු වීම සහ අපනයන ආදායමෙහි සුළු අඩු වීම සමඟ 2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු විය. සමුච්චිත ආනයන වියදමෙහි සැලකිය යුතු අඩු වීම සමඟ අපනයන ආදායමෙහි සමුච්චිත වැඩි වීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2019 වසරේ පළමු මාස දහය තුළදී වෙළඳ හිඟය අඩු විය. මේ අතර, සංචාරක පැමිණීම්වල පහත වැටීම 2019 ඔක්තෝබර් මාසයේදී තවදුරටත් සීමා විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සමුච්චිත වශයෙන් අඩුවීමක් වාර්තා කළද 2019 ඔක්තෝබර් මාසයේදී පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව වර්ධනය විය. 2019 ඔක්තෝබර් මාසයේදී මූල්‍ය ගිණුම තුළ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත සුළු ශුද්ධ ලැබීමක් වාර්තා විය. ඔක්තෝබර් මාසය තුළදී විනිමය අනුපාතිකය මිශ්‍ර හැසිරීමක් වාර්තා කළ අතර වසරේ මේ දක්වා කාලය තුළ එ.ජ.ඩොලරයට සාපේක්ෂව අතිප්‍රමාණය වී පැවතුණි.




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 ඔක්. එ.ජ.ඩො. මිලියන | 2019 ඔක්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2018 ජන.- ඔක්. එ.ජ.ඩො. මිලියන | 2019 ජන.- ඔක්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 979 | 977 | -0.2 | 9,877 | 9,960 | 0.8 |
| ආනයන | 1,882 | 1,816 | -3.5 | 18,734 | 16,412 | -12.4 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -903 | -838 | | -8,857 | -6,451 | |
| සංචාරක ඉපැයීම් | 287 (ආ) | 223 (ඇ) | -22.5 | 3,538 (ආ) | 2,806 (ඇ) | -20.7 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 599 | 607 | 1.3 | 5,876 | 5,537 | -5.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -36 | -10 | | 1 | 5 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 1,091 | 206 | | 5,404 | 6,244 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 17 | 57 | | 698 | 511 | |
| දිගුකාලීන ණය | 75 | 150 | | 1,206 | 1,333 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | 1,000 | - | | 1,000 | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 2,500 | 4,400 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 252 | 164 | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 1,422 | 501 | |
| සමස්ත ශේෂය | | | | -157 | 667 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- 2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ හිඟය 2018 වසරේ ඔක්තෝබර් මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 903 සිට එ.ජ. ඩොලර් මිලියන 838 ක් දක්වා අඩුවිය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස දහය තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,857 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,451 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,405 කින් අඩු විය. වෙළඳ හිඟය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයන මිල නිරූපණය කරන වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.7 කින් පහළ ගිය අතර, ඒ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස දහය තුළදී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.8 කින් පහළ ගියේය.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2019 ජනවාරි - ඔක්තෝබර් (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2018 – 2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2018 – 2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 977 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.2 කින් සුළු වශයෙන් අඩු වූ අතර කෘෂිකාර්මික අපනයන අඩුවීම ඒ සඳහා හේතුවිය.
- සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල අපනයන පහත වැටීම හේතුවෙන් 2019 ඔක්තෝබර් මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම අඩුවිය. මේ අනුව, තේ අපනයන පරිමාව ඉහළ ගියද, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තේ මිල ගණන් පහත වැටීම හා සමගාමීව තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් අඩු වීම හේතුවෙන් තේ අපනයන ආදායම පහත වැටුණි. මීට අමතරව, ප්‍රධාන වශයෙන් කුරුඳු අපනයන මිල ගණන් පහත වැටීම සහ කරාබු නැටි සහ ගම්මිරිස් සැපයුම අඩු

වීමත් සමග අපනයන පරිමාව අඩු වීම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම පහත වැටුණි. ඇමෙරිකා එක්සත් ජනපද වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම අඩු වීම හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහත වැටුණි.

- 2019 සැප්තැම්බර් මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටීමෙන් පසුව 2019 ඔක්තෝබර් මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර, ඒ සඳහා සියලුම ප්‍රධාන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායමෙහි මෑත කාලයේදී දක්නට ලැබුණු අඩු වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවති අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි බොරතෙල් මිල ගණන් පහළ මට්ටමක පැවතීම සමග නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධනවල මිල ගණන් අඩු වීම හේතු විය.
- සමස්ත අපනයනවලින් සියයට 0.4 ක් පමණ වන ඛනිජ නිෂ්පාදිත 2019 ඔක්තෝබර් මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර ඒ සඳහා යපස්, යබොර හා අලු අපනයනය ඉහළ යෑම හේතුවිය.
- 2019 ඔක්තෝබර් මාසයේදී අපනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 13.8 කින් ඉහළ ගිය අතර අපනයන මිල දර්ශකය සියයට 12.3 කින් පහත වැටුණි. මේ අනුව, 2019 ඔක්තෝබර් මාසයේදී අපනයන පහත වැටීම සඳහා මිල ගණන් අඩු වීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹුවේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2018 ඔක්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ඔක්. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- ඔක්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- ඔක්. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **757.4** | **762.1** | **0.6** | **7,657.0** | **7,839.0** | **2.4** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 42.7 | 38.7 | (9.5) | 389.9 | 376.0 | (3.6) |
| සත්ත්ව ආහාර | 8.3 | 14.2 | 70.5 | 91.1 | 109.1 | 19.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 426.6 | 441.6 | 3.5 | 4,354.5 | 4,628.4 | 6.3 |
| එයින් ඇඟලුම් | 395.8 | 407.9 | 3.1 | 4,062.7 | 4,305.6 | 6.0 |
| රෙදිපිළි | 23.0 | 25.4 | 10.2 | 213.4 | 235.8 | 10.5 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.8 | 8.3 | 6.9 | 78.4 | 87.0 | 11.0 |
| රබර් නිෂ්පාදිත | 71.4 | 70.3 | (1.6) | 727.6 | 732.5 | 0.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.3 | 30.0 | 23.5 | 238.8 | 254.6 | 6.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 35.8 | 33.4 | (6.6) | 364.2 | 341.4 | (6.2) |
| ප්‍රවාහන උපකරණ | 7.1 | 7.8 | 8.6 | 105.4 | 135.2 | 28.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 58.5 | 41.5 | (29.1) | 512.3 | 408.5 | (20.3) |
| රසායනික නිෂ්පාදිත | 13.6 | 14.5 | 7.1 | 141.6 | 148.7 | 5.0 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 12.5 | 10.3 | (18.0) | 116.9 | 111.7 | (4.4) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.5 | 5.4 | 258.5 | 24.8 | 38.5 | 55.1 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.1 | 7.0 | (23.2) | 128.2 | 89.2 | (30.4) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 6.2 | (6.1) | 63.9 | 61.3 | (4.1) |
| මූල ලෝහ හා උපාංග | 15.0 | 13.4 | (10.7) | 138.5 | 148.7 | 7.3 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.7 | 2.2 | (20.3) | 26.7 | 25.0 | (6.6) |
| වෙනත් | 21.5 | 25.7 | 19.5 | 232.6 | 230.3 | (1.0) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **217.3** | **210.2** | **(3.3)** | **2,175.0** | **2,079.1** | **(4.4)** |
| තේ | 115.5 | 113.8 | (1.5) | 1,208.2 | 1,139.1 | (5.7) |
| රබර් | 2.4 | 1.2 | (50.8) | 27.5 | 21.3 | (22.7) |
| පොල් | 28.6 | 26.3 | (8.0) | 266.7 | 284.8 | 6.8 |
| කුළුබඩු | 33.2 | 32.6 | (1.9) | 302.5 | 267.4 | (11.6) |
| එළවළු | 3.0 | 2.9 | (4.6) | 23.9 | 27.0 | 12.6 |
| සකස් නොකළ දුම්කොළ | 2.5 | 2.2 | (13.7) | 29.2 | 28.0 | (4.4) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.7 | 12.1 | 38.7 | 102.5 | 92.1 | (10.1) |
| මුහුදු ආහාර | 23.3 | 19.2 | (17.7) | 214.4 | 219.6 | 2.4 |
| **3. ඛනිජ අපනයන** | **2.8** | **3.5** | **21.6** | **30.0** | **28.1** | **(6.3)** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.6** | **1.5** | **(5.5)** | **14.7** | **14.2** | **(3.6)** |
| **මුළු අපනයන** | **979.1** | **977.3** | **(0.2)** | **9,876.7** | **9,960.5** | **0.8** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අඛණ්ඩව දොළොස්වැනි මාසයටත් එ.ජ. ඩොලර් මිලියන 1,816 ක් දක්වා සියයට 3.5 කින් අඩුවිය. පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පහළ යෑම මේ සඳහා හේතු විය.
- ආහාර හා පාන වර්ග ආනයනය ඉහළ ගියද පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයනය පහත වැටීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ යෑමෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් සහනදායී බලපත්‍ර මගින් රථවාහන ආනයනය කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් 2019 වසරේ පළමු භාගයේදී වාර්තා කළ අගයන්ට සාපේක්ෂව ජූලි මාසයේ සිට පෞද්ගලික රථවාහන ආනයන වියදම ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් එළඹුණු සඳහා වූ දේශීය සැපයුම අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළඹුණු ආනයනය ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගියේය.
- ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2019 ඔක්තෝබර් මාසයේදී අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර ඒ සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඉන්ධන මිල ගණන් පහත වැටුණද බොරතෙල් සහ ගල් අඟුරු ආනයන පරිමා ඉහළ යෑම හේතු විය. මීට අමතරව, යකඩ හා වානේ ආනයනය ඉහළ යෑමත් සමග 2019 ඔක්තෝබර් මාසයේදී මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ආනයන පරිමාව අඩුවීම හේතුවෙන් තිරිඟු හා ඉරිඟු ආනයන වියදම පහත වැටුණු අතර කපු නූල් හා රෙදි වර්ග ආනයනය අඩු වීම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සුළු වශයෙන් අඩු විය.
- මේ අතර, පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරවල පසු බලපෑමද ඇතුලත්ව කාර්මික අංශයේ කටයුතු මන්දගාමී වීම සමඟ 2019 ඔක්තෝබර් මාසයේදී ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති සියලුම උප කාණ්ඩවල ආනයන අඩු වීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. මේ අනුව, ප්‍රධාන වශයෙන් රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කරන යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රසූත්‍ර කොටස් ආනයනය අඩුවීම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පහත වැටුණු අතර, ට්‍රැක්ටර්, ගිලන්රථ සහ ත්‍රිරෝද රථ වැනි වාණිජ කටයුතු සඳහා භාවිතා කරනු ලබන රථවාහන ආනයනය පහත වැටීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහත වැටුණි. පාලම් හා පාලම් කොටස් තැනීම සඳහා භාවිතා කරනු ලබන යකඩ හා වානේ හා ඒ ආශ්‍රිත උපාංග ආනයන ඉහළ ගියද යකඩ පොලු හා දඬු ආනයනය පහත වැටීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටුණි.
- 2019 ඔක්තෝබර් මාසයේදී ආනයන පරිමා දර්ශකය සියයට 3.8 කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 7.0 කින් පහත වැටුණි. මෙමගින් 2018 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව ආනයන අඩුවීම සඳහා ආනයන මිල ගණන් අඩුවීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරීත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2018 ඔක්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ඔක්. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- ඔක්. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- ඔක්. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **438.5** | **383.3** | **(12.6)** | **4,259.1** | **3,195.3** | **(25.0)** |
| ආහාර හා පාන වර්ග | 121.2 | 128.9 | 6.3 | 1,360.4 | 1,138.2 | (16.3) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.5 | 4.0 | 58.5 | 118.0 | 28.8 | (75.6) |
| එයින් සහල් | 1.0 | 1.5 | 53.1 | 102.5 | 10.1 | (90.1) |
| කිරි නිෂ්පාදිත | 29.5 | 25.5 | (13.6) | 273.6 | 250.4 | (8.5) |
| එළවළු | 20.6 | 29.6 | 43.9 | 256.1 | 237.2 | (7.4) |
| මුහුදු ආහාර | 16.6 | 19.0 | 14.6 | 166.6 | 179.0 | 7.5 |
| සීනි හා රසකැවිලි | 13.4 | 17.5 | 30.4 | 210.1 | 160.2 | (23.8) |
| කුළුබඩු | 11.2 | 10.6 | (5.9) | 95.6 | 90.1 | (5.8) |
| පාන වර්ග | 9.6 | 9.3 | (2.6) | 73.8 | 67.6 | (8.4) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 17.9 | 13.4 | (25.0) | 166.7 | 124.9 | (25.1) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 317.3 | 254.4 | (19.8) | 2,898.7 | 2,057.1 | (29.0) |
| පෞද්ගලික රථවාහන | 160.8 | 84.6 | (47.4) | 1,391.4 | 651.0 | (53.2) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 48.6 | 54.2 | 11.6 | 442.1 | 453.6 | 2.6 |
| රෙදිපිළි හා උපාංග | 22.8 | 26.9 | 18.2 | 260.1 | 230.6 | (11.4) |
| ගෘහ උපකරණ | 23.0 | 19.2 | (16.7) | 199.3 | 165.7 | (16.8) |
| විදුලි සංදේශ මෙවලම් | 19.7 | 25.9 | 31.4 | 226.8 | 199.4 | (12.1) |
| ගෘහ හා දැව භාණ්ඩ | 14.6 | 17.7 | 21.3 | 143.6 | 140.4 | (2.3) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 27.8 | 26.0 | (6.7) | 235.5 | 216.4 | (8.1) |
| **2. අන්තර් භාණ්ඩ** | **1,017.5** | **1,040.2** | **2.2** | **10,430.3** | **9,420.7** | **(9.7)** |
| ඉන්ධන | 265.9 | 308.3 | 15.9 | 3,431.0 | 3,238.8 | (5.6) |
| එයින් බොරතෙල් | 62.0 | 95.0 | 53.3 | 776.0 | 824.3 | 6.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 200.9 | 192.4 | (4.2) | 2,504.6 | 2,245.2 | (10.4) |
| ගල් අඟුරු | 3.1 | 20.9 | 579.7 | 150.4 | 169.2 | 12.5 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 13.2 | 19.0 | 43.2 | 542.9 | 158.1 | (70.9) |
| එයින් රත්‍රන් | 0.5 | 0.0 | (99.5) | 438.6 | 2.3 | (99.5) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 279.7 | 277.1 | (0.9) | 2,371.3 | 2,404.2 | 1.4 |
| රසායනික නිෂ්පාදිත | 90.1 | 76.9 | (14.7) | 761.1 | 698.2 | (8.3) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 64.0 | 61.0 | (4.7) | 585.8 | 506.1 | (13.6) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 46.6 | 46.6 | 0.0 | 441.3 | 382.7 | (13.3) |
| මූල ලෝහ | 46.6 | 69.1 | 48.2 | 519.8 | 477.8 | (8.1) |
| පොහොර | 23.1 | 27.4 | 18.5 | 210.9 | 194.9 | (7.6) |
| තිරිඟු හා ඉරිඟු | 53.9 | 33.0 | (38.8) | 326.6 | 266.9 | (18.3) |
| ආහාර සැකසුම් | 20.2 | 20.9 | 3.8 | 254.2 | 190.2 | (25.2) |
| කෘෂිකාර්මික යෙදවුම් | 17.5 | 14.9 | (14.7) | 170.9 | 155.6 | (9.0) |
| ඛනිජ නිෂ්පාදිත | 20.8 | 26.4 | 26.5 | 158.2 | 185.4 | 17.2 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 75.8 | 59.7 | (21.3) | 656.4 | 561.8 | (14.4) |
| **3. ආයෝජන භාණ්ඩ** | **425.7** | **391.0** | **(8.2)** | **3,970.4** | **3,789.4** | **(4.6)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 233.5 | 218.2 | (6.5) | 2,112.1 | 2,034.9 | (3.7) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 138.7 | 133.8 | (3.5) | 1,279.4 | 1,277.2 | (0.2) |
| ප්‍රවාහන උපකරණ | 53.1 | 38.5 | (27.4) | 573.8 | 471.9 | (17.8) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.4 | (24.6) | 5.1 | 5.3 | 3.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.7** | **1.2** | **75.8** | **73.7** | **6.4** | **(91.3)** |
| **මුළු ආනයන** | **1,882.5** | **1,815.7** | **(3.5)** | **18,733.5** | **16,411.8** | **(12.4)** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව බලපෑමට ලක් වූ සංචාරක පැමිණීම් මෑත කාලයේදී අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණි. 2019 ඔක්තෝබර් මාසයේ සංචාරක පැමිණීම් 118,743 ක් වාර්තා වූ අතර එය 2019 වසරේ සැප්තැම්බර් මාසයේ වාර්තා වූ සියයට 27.2 ක අඩු වීම සහ අගෝස්තු මාසයේදී වාර්තා වූ සියයට 28.3 ක අඩුවීමට සාපේක්ෂව සියයට 22.5 ක අඩු වීමකි. මෙම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එක්සත් රාජධානිය සහ චීනය වැනි ප්‍රධාන රටවල්වලින් පැමිණි සංචාරකයින් ගණන අඩු වීමයි.
- 2018 ඔක්තෝබර් මාසයේදී වාර්තා වූ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 287 ට සාපේක්ෂව 2019 ඔක්තෝබර් මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 223 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමුච්චිත පදනම මත, සංචාරක ඉපැයීම් 2018 වසරේ පළමු මාස දහය තුළදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,538 ට සාපේක්ෂව මෙම වසරේ අනුරූප කාලය තුළදී එ.ජ. ඩොලර් මිලියන 2,806 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 ඔක්තෝබර් මාසයේදී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 607 ක් දක්වා සියයට 1.3 කින් වැඩි විය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස දහය සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 5,537 ක් දක්වා සියයට 5.8 කින් පහත වැටුණි.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 වසරේ ඔක්තෝබර් මාසයේදී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 12 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, වසරේ පළමු මාස දහය තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 280 ක් විය.
- ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන, 2019 වසරේ ඔක්තෝබර් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 10 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එසේ වුවද, 2019 වසරේ පළමු මාස දහය තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 5 ක සුළු ශුද්ධ ලැබීමක් වාර්තා විය.
- තවද, 2019 ඔක්තෝබර් මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 102 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 වසරේ ඔක්තෝබර් මස අවසානය වනවිට දළ නිළ සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.8 ක් වූ අතර, එය ආනයනික මාස 4.7 කට සමාන විය. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 ඔක්තෝබර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.4 ක් වූ අතර, එය ආනයනික මාස 6.3 කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා රුපියල යම් අවප්‍රමාණය වීමේ පීඩනයකට ලක් වුවද, මෙම වසරේ ඔක්තෝබර් අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය. තවද, 2019 වසරේ දෙසැම්බර් මස 13 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 1.0 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, ස්ටර්ලින් පවුම සහ කැනේඩියානු ඩොලරය හැර අනෙකුත් සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 (දෙසැ. 13 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +1.0% |
| යූරෝ | -12.7% | +3.4% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -4.9% |
| ජපන් යෙන් | -18.1% | +0.2% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -2.4% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +3.0% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.0% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව